සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2025 ජනවාරි

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

2025-02-01
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
  *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  (6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  (7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**සීමාසහිත සෙවන හෝම්ස් (පෞද්ගලික) සමාගම,** ශ්‍රී ලංකාව තුළ සුළු පරිමාණයේ මහල් නිවාස ඉදිකිරීමෙහි සහ විකිණීමෙහි නිරතව සිටී. පසුගිය වසර දෙකක කාලය, සමාගමට අතිශයින්ම දුෂ්කර කාල වකවානුවක් විය. කෙසේවෙතත්, මීට වසර තුනකට පමණ පෙර සම්පූර්ණ කරන ලද නිවාස ඒකක කිහිපයක් ප්‍රවර්තන වර්ෂයේදී විකිණීමට සමාගමට හැකි විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සීමාසහිත සෙවන හෝම්ස් (පෞද්ගලික) සමාගමට** සෘණාත්මකව බලපෑ හැකි ආර්ථික සාධක තුනක්(03) **පැහැදිලි කරන්න.**

(ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත Coco පොදු සමාගම** සතුව පොල් වතු පවතින අතර, සමාගම, ඉහළ ගුණත්වයෙන් යුතු පොල්තෙල් නිෂ්පාදනයෙහි නිරතව සිටී. සමාගම සතුව පවතින පොල්වතුවල ඵලදාව ප්‍රමාණවත් නොවන විට දිසිදි පොල් (desiccated coconuts) ද මිලට ගනු ලබයි.

මෑතකදී, SLS තත්ත්ව සහතික විගණනයක් සිදු කළ අතර, එහිදී හෙළිදරව් වූයේ පසුගිය මාසයේදී මිලට ගන්නා ලද දිසිදි පොල් තොග තුළ අහිතකර ඇල්ගී සමන්විත බවත්, ඒ හේතුවෙන් දැනට සමාගම සතුව පවතින පොල් තෙල් තොගවලට සහ වෙළෙඳපොළට නිකුත් කරන ලද තොගවලට ඒ තුළින් බලපෑමක් ඇතිකර ඇති බවයි. ආහාර සුරක්ෂිතතා රෙගුලාසි කඩ කිරීම නිසා අඩු ගුණත්වයෙන් යුතු පොල්තෙල් පිළිබඳව පාරිභෝගික ආරක්ෂණ අධිකාරියට හා මහජන සෞඛ්‍ය අධිකාරියට දැනුම්දීමට මෙමගින් බැඳී සිටී. සේවකයින්ද මෙම ගැටළුව පිළිබඳව දැනුවත් නිසා බොහෝ දුරට මෙම පුවත ජනමාධ්‍ය තුළද පැතිරයාමට ඉඩකඩක් ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සිද්ධිය තුළ සඳහන්, අභ්‍යන්තර අවදානම් දෙකක්(02) **පැහැදිලි කරන්න.**

(ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

විගණන කාර්යභාරයක් ඉටු කිරීමේදී, විගණක විසින් විවිධ ආකාරයේ විගණන ක්‍රියාපටිපාටි මගින් විගණන සාක්ෂි ලබාගනු ලැබේ.

**ඔබ විසින් කල යුතු දෑ:**

විගණක විසින් විගණන සාක්ෂි ලබාගැනීම සඳහා ඉටුකල හැකි විගණන ක්‍රියාපටිපාටි වර්ග දෙකක්(02) එක් එක් ක්‍රියාපටිපාටියට උදාහරණයක්ද සහිතව **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සුසන්ත** සතුව වෘත්තීය සුදුසුකමක් පවතින අතර, ඔහුගේ පරිචයේ යෙදීමේ සහතිකය (practicing certificate) භාවිත කරමින්, **S & A ඇසෝසියේට්ස්** නමින් වූ විගණන ආයතනයක් ඔහු විසින් ස්ථාපිත කරන ලදී. 2024 වර්ෂයේදී සේවාදායකයින් කිහිප දෙනෙකුම ඔවුන්ගේ බාහිර විගණක වශයෙන් මෙම විගණන සමාගම පත්කර ගන්නා ලදී. ආයතනය තුළ තත්ත්ව පාලනයන් ස්ථාපිත කිරීමේ වැදගත්කම සහ විගණන කාර්යභාරයන් සිදුකිරීමේදී තත්ත්වපාලන ප්‍රමිතයන් අනුගමනය කිරීමේ වැදගත්කම **සුසන්ත** විසින් සිය සේවකයින්ට සන්නිවේදනය කර ඇත.

**ඔබ විසින් කල යුතු දෑ:**

(a) තත්වපාලන පද්ධතියක මූලිකාංග (elements) දෙකක්(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(b) කාර්යභාර කාර්යසාධනයේ තත්වපාලනයේ (ගුණාත්මකභාවයේ) අඛණ්ඩතාවය පවත්වා ගැනීම සඳහා විගණන ආයතනය විසින් අවධාරණය යොමු කල යුතු කරුණු තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# B කොටස

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

ඔබ, **සීමාසහිත ABC Construction (පෞද්ගලික) සමාගමෙහි** (ABC) බාහිර විගණනය භාර, විගණන සුපරීක්ෂක වේ.

විගණන සැලැස්ම පිළියෙල කරන අවස්ථාවේදී, 2024 මාර්තු 31 දිනට **ABC හි** කෙටුම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පහත සඳහන් ශේෂයන් අන්තර්ගතව ඇති බව ඔබට නිරීක්ෂණය විය:

**2024 මාර්තු 31 දිනට**

| | රු |
|---|---:|
| දේපළ, පිරියත සහ උපකරණ, ධාරණ අගයට | 4,190,360 |
| ජංගම වත්කම් | 11,102,170 |
| **මුළු වත්කම්** | **15,292,530** |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 2,000,000 |
| 2023 අප්‍රේල් 01 දිනට සමුච්චිත අලාභ | (7,122,460) |
| වසරේ අලාභය | (1,125,400) |
| ජංගම වගකීම් | 21,540,390 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **15,292,530** |

**සීමාසහිත BCC Construction (පෞද්ගලික) සමාගම** (BCC), වෙත ලබා දුන් රු. මිලියන 10 ක ණය මුදලක් **ABC සමාගමේ** ජංගම වත්කම් තුළ ඇතුලත් වන අතර, **ABC සමාගමෙහි** කොටස්හිමියන් සහ අධ්‍යක්ෂකවරුන්, **BCC සමාගමේ** ද කොටස්හිමියන් සහ අධ්‍යක්ෂකවරුන් වේ.

ඉදිකිරීම් කර්මාන්තයෙහි පවතින කඩා වැටීම් නිසා, පසුගිය වසර තුනක කාලය තුළදී, **ABC සමාගම,** මෙහෙයුම් අලාභ වාර්තාකොට ඇත.

රු. මිලියන 300 කට අධික වටිනාකමකින් යුත් ප්‍රධාන ව්‍යාපෘතියක් සඳහා ගිවිසුමකට අත්සන් තබා ඇති නිසා 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂයේදී **ABC සමාගම** විසින් අධික ලාභයක් ඉපැයීමට බලාපොරොත්තු වන බව **ABC සමාගමෙහි** අධ්‍යක්ෂකවරු විසින් ඔබගේ කාර්යභාර හවුල්කරුට දන්වා ඇත.

**ඔබ විසින් කල යුතු දෑ:**

(a) **සීමාසහිත ABC Construction (පෞද්ගලික) සමාගම** විසින් භාවිත කරනු ලබන අඛණ්ඩ පැවැත්ම උපකල්පනය පිළිබඳව සැකයක් ඇති කිරීමට තුඩුදෙන තත්වයන් (conditions) / සිද්ධි දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) **BCC සමාගම** වෙත ලබා දුන් ණය මුදල විගණනය කිරීමේදී, ඔබ විසින් ඉටුකළ යුතු විගණන ක්‍රියාපටිපාටි තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(c) හෙළිදරව් නොකරන ලද සම්බන්ධිත පාර්ශවයන් සමඟ වූ ගනුදෙනු විගණක විසින් අනාවරණය කර නොගැනීමේ අවදානමක් ඇති වීමට තුඩු දිය හැකි අවස්ථාවන් තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත Travelex සමාගම,** සංචාරක ඒජන්සියක් පවත්වාගෙන යන අතර, සමාගම විදේශ සංචාර සූදානම් කිරීමෙහි හා ගුවන් ටිකට්පත් අලෙවි කිරීමෙහි නිරතව සිටී.

**තිසේරා කුරුප්පු, තිසේරා ඇසෝසියේට්ස්** නම් විගණන සමාගමේ එකම පරිචයෙහි යෙදෙන්නා වන අතර, එහි සිටින සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරීවරයෙකු වන **සචින්, සීමාසහිත Travelex සමාගමෙහි** 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යවස්ථාපිත විගණනය භාර විගණන කළමනාකරු වේ. ව්‍යවස්ථාපිත විගණනය තවමත් සිදු කෙරෙමින් පවතී. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ ආදායම් බදු ප්‍රතිපාදනය හා විලම්භිත බදු ප්‍රතිපාදනය පිළියෙල කිරීමට **සචින්** විසින් ගණකාධිකාරීවරයාට දක්වන ලද සහාය නිසා සමාගමේ කළමනාකාරීත්වය විසින් **තිසේරා** සහ **සචින්** වෙත ත්‍යාගයක් ලෙස ඉන්දීය සංචාරයක් පිරිනමා ඇත. **සචින්ගේ** අරමුණ වූයේ විගණන ආයතනයට නව බදු ව්‍යාපාර ක්ෂේත්‍රයන් ප්‍රවර්ධනය කිරීමයි. දිවා ආහාරය සඳහා මුණ ගැසුනු අවස්ථාවේදී නව ආදායම් බදු සේවාවන් පිළිබඳව **සචින්** විසින් **සීමාසහිත Travelex සමාගමේ** ගණකාධිකාරීවරයාට කෙටියෙන් පවසා ඇත.

**ඔබ විසින් කල යුතු දෑ:**

(a) ඉහත කරුණු සම්බන්ධයෙන් ආචාරධර්මවල මූලික මූලධර්මයන්ට අනුකූල වීමේ තර්ජන (threats) දෙකක්(02) **විමසන්න.** (ලකුණු 06)

(b) ඉහත සඳහන් කළ තර්ජන අඩු කිරීමට / ඉවත් කිරීමට, **තිසේරා ඇසෝසියේට්ස්** විසින් ස්ථාපිත කළ යුතු පියවර හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත ජයරත්න හාඩ්වෙයාර් (පෞද්ගලික) සමාගම** *(සමාගම)*, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය කිරීම සහ දේශීය නියෝජිතයින් හරහා විකිණීමෙහි නිරතව සිටී. රට තුළ පැවති අහිතකර ආර්ථික තත්ත්වය හේතුවෙන් බොහෝ ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ගණන් සීඝ්‍ර වශයෙන් පසුගිය වසර දෙකක කාලය තුළ ඉහළ ගොස් ඇත. තව දුරටත් මිල ගණන් ඉහළ යනු ඇතැයි අපේක්ෂාවෙන් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂකවරයාගේ උපදෙස් මත මූල්‍ය ආයතනයකින් වසරකින් ගෙවා නිම කිරීමට ලබාගත් ආනයන මත ණය මුදලක් භාවිතයෙන් රු. මිලියන 125 ක අමතර ගොඩනැගිලි ද්‍රව්‍ය තොගයක් ආනයනය කර ඇත.

කෙසේවෙතත්, මෙම ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා වූ ඉල්ලුම, තවදුරටත් පහළ ගිය අතර, ලබාගත් ණය මුදල, වසර පහක බැංකු ණය මුදලකට ප්‍රතිව්‍යුහගත කරන ලෙස සමාගම විසින් බැංකුවෙන් ඉල්ලීමක් කර ඇත. තවද, මෙම අයිතමවල දේශීය මිල ගණන් පහළ යන ලදී.

2024 මාර්තු 31 දිනට වූ සමාගමේ කෙටුම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ තොගය ලෙස මෙම ගොඩනැගිලි ද්‍රව්‍යවල වටිනාකම පිරිවැයට රු.74,125,300/- කට පිළිබිඹු වේ. කෙසේවෙතත්, මෙම ද්‍රව්‍යවල ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV)] රු.41,260,415/- ක් ලෙස තක්සේරු ගත කර ඇති අතර, සමාගමේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශවල ලාභය රු.8,560,210/- ක් ලෙස පෙන්නුම් කෙරේ.

වාර්තා කරන ලද කාර්යසාධනයට බලපෑමක් ඇති කර එම තත්ත්වය අනාගත බැංකු පහසුකම් සඳහා බලපෑම් ඇතිකළ හැකි බව උපකල්පනය කරමින් කළමනාකරණ අධ්‍යක්ෂකවරයා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් අගයන් වෙනස් කිරීමට, එකඟ නොවීය.

ඔබ, සමාගමේ බාහිර විගණක වන අතර, බදු පෙර ලාභය මත නිශ්චය කරන ලද ප්‍රමාණාත්මක මට්ටම රු. මිලියන 1.2 ක් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත ජයරත්න හාඩ්වෙයාර් (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශන මත විගණන වාර්තාවෙහි විගණන මතයට, ඉහත සඳහන් කරුණු හේතුවෙන් ඇතිවිය හැකි බලපෑම **තක්සේරු කරන්න**. (ලකුණු 06)

(b) විගණකගේ වාර්තාවෙහි ප්‍රධාන මූලිකාංග (key elements) හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත ටේස්ට් (පෞද්ගලික) සමාගම** *(සමාගම)*, දේශීය වෙළෙඳපොළ සඳහා පිටිකළ පොල්කිරි නිෂ්පාදනයෙහි නිරතව සිටී. දැනට සමාගම සිය නිෂ්පාදිත, සුපිරි වෙළෙඳපොළවල් 10 කට සහ අලෙවි නියෝජිතයින් 100 කටත් සපයයි. සමාගමේ සේවකයින් 100 කට අධික ප්‍රමාණයක් සේවයේ නිරතව සිටිති.

පසුගිය මාසයේදී, අඩු ගුණත්වය හේතුකොටගෙන එක් සුපිරි වෙළෙඳසැලක් විසින් මිලට ගන්නා ලද සියලුම පිටිකළ පොල් කිරි නිෂ්පාදිත ආපසු එවන ලදී. මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකරන ලද අතර, එහිදී අනාවරණය වූයේ නිෂ්පාදිතවල නියැදියක් සුදුසුකම්ලත් තත්ත්ව පාලකයෙකු විසින් පරීක්ෂා කර නොමැති බවත් පරීක්ෂාවට ලක්කර ඇත්තේ ගබඩා පාලක විසින් බවත් ය.

**සීමාසහිත ටේස්ට් (පෞද්ගලික) සමාගමේ** අභ්‍යන්තර පාලන පද්ධතියෙහි මෙහෙයුම් කාර්යක්ෂමතාවය පිළිබඳව සමාලෝචනයක් කර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර විගණන කණ්ඩායමට දන්වන ලදී.

අභ්‍යන්තර විගණන කණ්ඩායම විසින් පහත සඳහන් දෑ හඳුනා ගන්නා ලදී:

- තොග පාලන පද්ධතිය තුළ පවතින්නේ තොග ප්‍රමාණයන් (quantities) පමණක් නිසා එම අයිතම පොදු ලෙජරය සමඟ සැසඳීමකට ලක්කළ නොහැකිය.
- තොග අගය කිරීම්, හස්තමය (manually) ආකාරයට පවත්වා ගෙන යනු ලබයි.
- නිතිපතා සිදුකරනු ලබන පරිචයක් ලෙස අභ්‍යන්තර විගණන කණ්ඩායම සම්පූර්ණ තොගයෙහිම භෞතික පරීක්ෂාවක් සිදුකර තිබේ. සමාගමේ තොගය තුළ කල් ඉකුත් වූ පිටිකල තොග විශාල ප්‍රමාණයක් ඇති බවට අනාවරණය විය.
- ලියාපදිංචි සැපයුම්කරුවන් සිටින නමුත්, සමහර අමුද්‍රව්‍ය ලියාපදිංචි නොකල සැපයුම්කරුවෙකුගෙන් ලබාගෙන ඇති අතර, ඒවා නිෂ්පාදන කටයුතු සඳහා යොමු කිරීමට පෙර එහි තියැදියක් පරීක්ෂාවට ලක්කර නොමැත.
- සැපයුම්කරුවන් සඳහා ගෙවීම් සිදුකිරීමේදී, සමහර ගැණුම් ඇණවුම් (purchase orders), ඉන්වොයිසි සමඟ එකඟ වී නොමැත.

**තොරතුරු තාක්ෂණ පද්ධති:**

සමාගම, ස්ථාවර වත්කම් රෙජිස්ටරය, ඉන්වොයිස් නිකුත් කිරීම, වැටුප් ලේඛණ, යනාදී වශයෙන් විවිධ ආකාරයේ කාර්යයන් සඳහා තොරතුරු තාක්ෂණ පද්ධති භාවිත කරනු ලබයි. මේවා, පොදු ලෙජරය සමඟ ඒකාබද්ධ කර නොමැත. එක් එක් දිනය අවසානයේදී කාණ්ඩ වශයෙන් වූ සටහන්, ගිණුම් විධායක විසින් පොදු ලෙජරයෙහි වාර්තා කරනු ලබයි. වාර්තා පවත්වා ගැනීම සඳහා තනි පරිශීලක ගිණුමක් හරහා පද්ධති සියල්ලටම සහ දත්ත සමුදායන්ට සමස්ත මූල්‍ය දෙපාර්තමේන්තුවටම ප්‍රවේශ විය හැකිය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත වෙස්ට් (පෞද්ගලික) සමාගමේ** ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාවලි (key business processes) හතරක්(04) **හඳුනා දක්වන්න** (ලකුණු 04)

(b) (i) **සීමාසහිත වෙස්ට් (පෞද්ගලික) සමාගමේ** අභ්‍යන්තර පාලන දුර්වලතා හතරක්(04) **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(ii) ඉහත (b) (i) හි හඳුනා ගන්නා ලද එක් එක් පාලන දුර්වලතාවය මඟ හරවා ගැනීම සඳහා යෝජනාවක් බැගින් **සඳහන් කරන්න.** (ලකුණු 04)

(c) **සීමාසහිත වෙස්ට් (පෞද්ගලික) සමාගම** විසින් ස්ථාපිත කළ හැකි පාලන ක්‍රියාකාරකම් තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(d) **සීමාසහිත වෙස්ට් (පෞද්ගලික) සමාගමෙහි** වැඩසටහන්වලට අනවසර වෙනස්කම් සිදුකිරීම වලක්වා ගැනීම හෝ අනාවරණය කර ගැනීම සඳහා භාවිත කළ හැකි පොදු පාලනයන් සඳහා උදාහරණ හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(e) පොදුවේ ඕනෑම අභ්‍යන්තර පාලන පද්ධතියක් තුළ දුර්වලතා ඇති කිරීමට තුඩුදෙන සංඥා (signs) තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

**සීමාසහිත Malcom පොදු සමාගම** *(සමාගම)*, **'Rodex'** නම් ජපන් ටයර් සන්නාමයක් සඳහා ශ්‍රී ලංකාවේ සිටින එකම අලෙවි නියෝජිතයා වේ. මෙම වසරට අදාල විගණක ලෙස සමාගම විසින් **Apex NW** පත්කර ඇති අතර, එය **Apex NW** විසින් **සීමාසහිත Malcom පොදු සමාගම** විගණනය කරනු ලබන පළමු වසර වේ. ලැයිස්තුගත පොදු සමාගමක් වන බැවින් සහ එහි විගණනය **Apex NW** විසින් සිදුකරනු ලබන පළමු විගණනය වන බැවින් මෙම සමාගම ඉහළ අවදානමක් ඇති ලෙස සැලකිල්ලට ගෙන ඇත.

**විකුණුම් හා ණයගැතියන්:**

**සීමාසහිත Malcom පොදු සමාගමේ** ඉහළම ණයගැතියන් 10 දෙනාට අදාලව ණයගැතියන්ගේ ගිණුමේ වාර්තා කර ඇති විකුණුම් ඉන්වොයිසි විගණක විසින් පරීක්ෂා කර ඇති අතර, එම ණයගැතියන්ට අදාලව සෘජු තහවුරු කිරීම් ලබා ගැනීමටද කටයුතු කර ඇත. 2024 මාර්තු 31 දිනට පිළිවෙලින් රු.6,450,000/- ක සහ රු.7,900,000/- ක ලැබිය යුතුව ඇති ණයගැතියන් දෙදෙනෙක් (02) **සීමාසහිත Malcom පොදු සමාගම** වෙත ඔවුන් විසින් කිසිදු මුදලක් ගෙවීමට නොමැති බව තහවුරු කර තිබේ.

ආයතනික ගනුදෙනුකරුවන්, අලෙවි අධ්‍යක්ෂක විසින් සෘජුවම කළමනාකරණය සිදු කරන අතර, ඔහුට විකුණුම් කොමිස් මුදලක් ලබා ගැනීමට හිමිකම් ඇත. සියලුම විකුණුම් සිදුව ඇති බවත්, ණයගැති ශේෂයන්වල පැවැත්ම සාධාරණීකරණය කිරීමට ලේඛණ පවතින බවත් ප්‍රධාන විධායක නිලධාරියා ඇතුළු කළමනාකාරිත්වය විසින් දන්වා ඇත. සමාගමේ ප්‍රතිපත්තියක් අනුව, ශේෂය වසරක් තුළ අයකර ගත නොහැකි වන්නේ නම් ඊළඟ වසරේදී සම්පූර්ණ ප්‍රතිපාදනයක් සිදුකරනු ලබයි. ණයගැතියක් විසින් ඇතැම් ඉන්වොයිසි සඳහා ගෙවීම් කිරීමේදී, එම ණය පියවීම් වෙනුවට, ඒවා විකුණුම් ලෙස හඳුනාගෙන ඇති බවටත් ඇතැම් ඉන්වොයිසි විකුණුම් ලෙජරයේ දෙවරක් සටහන්ව ඇති බවටත් සැසඳුම් ක්‍රියාවලියේදී විගණක සොයාගෙන ඇත. මේ බව ප්‍රධාන විධායක නිලධාරියා වෙත දැනුම් දී ඇත. අවදානම මගහරවා ගැනීම සඳහා අමතර නියැදි පරීක්ෂා කරන ලද අතර, එහිදී වෙනත් කිසිදු ගැටළුවක් අනාවරණය නොවිය.

2024 මාර්තු 31 දිනට විගණනය නොකළ මූල්‍ය තොරතුරුවල සාරාංශයක් පහත දැක්වේ:

| | රු.'000 |
|---|---|
| පිරිවැටුම | 1,855,000 |
| බදු පෙර ලාභය | 326,000 |
| මුළු වත්කම් | 2,769,000 |
| ශුද්ධ වත්කම් | 1,055,000 |

**විගණක විසින් හඳුනා ගන්නා ලද අනෙකුත් කරුණු:**

- උපචිත නොකරන ලද පසුගිය මාසයේ බැංකු ණය සඳහා වූ පොලිය රු.2,050,000/- ක් විය.
- පොලී ආදායම රු.313,000/- කින් වැඩියෙන් සටහන් වී ඇත.
- පහත සඳහන් සම්බන්ධිත පාර්ශව ගනුදෙනුව, මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කර නොමැත:
    - සම්බන්ධිත පාර්ශවයක් සඳහා සිදු කළ විකුණුම් - රු.200,000/-.

ණයගැතියන්ගෙන් ලද මුදල්, විකුණුම් ලෙස සටහන් වීම, කළමනාකාරිත්වය සම්බන්ධ වී ඇති වංචා අවදානමක් සඳහා ඉඟියක් ලෙස විගණක සලකනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත Malcom පොදු සමාගමට** අදාල විගණන ක්‍රියාපටිපාටි ඉටු කිරීමේදී, විශේෂ අවධානයක් දිය යුතු අංශ / ක්ෂේත්‍ර පහක්(05) **හඳුනා දක්වන්න.** (ලකුණු 05)

(b) සාධාරණ සහතිකවීම් කාර්යභාරයක්, සීමිත සහතිකවීම් කාර්යභාරයකින් වෙනස් වන්නේ කෙසේද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) **සීමාසහිත Malcom පොදු සමාගමේ** විගණනයට අදාලව සැලසුම් කිරීම වැදගත් වීමට හේතු හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(d) (i) වංචා සහගත මූල්‍ය වාර්තාකරණය යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(ii) වංචා වැළැක්වීම සහ අනාවරණය කිරීම සම්බන්ධයෙන් **සීමාසහිත Malcom පොදු සමාගමේ** කළමනාකාරිත්වයේ වගකීම **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(e) **සීමාසහිත Malcom පොදු සමාගමේ** කළමනාකාරිත්වය සහ පාලනය පිළිබඳ වගකිවයුතු පාර්ශවයන් සමඟ සන්නිවේදනය කළ යුතු කරුණු තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අදින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |